රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 10/2004

මගේ අංකය : PA/CS/MAS/2
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
2004.12.30

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් සහ
රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය ක්‍රියාත්මක කිරීම**

අංක. 1372/23 සහ 2004.12.24 දතම රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කලමනාකරණ සහකාර සේවයේ (ඉදිරියේ දී "සේවය" ලෙස දැක්වෙන) සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2004.01.01 වන දින සිට ක්‍රියාත්මක වේ. මෙම සේවයට අන්තර්ග්‍රහණය කරන නිලධරයන් සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවයට අයත්,

සාමාන්‍ය ලිපිකාර සේවය,
රජයේ යතුරුලේඛක සේවය,
රජයේ ලඝුලේඛක සේවය,
රජයේ පොත්තබන්නා සේවය,
රජයේ සරප් සේවය, සහ
රජයේ ගබඩා භාරකාර සේවය

යන සේවාවන්ට අදලව පැවති සේවා ව්‍යවස්ථාවන් 2004.01.01 වන දින සිට බල පවත්වනු නොලැබේ. එසේ වුව ද 2004.01.01 වන දිනට පෙර එකී සේවා ව්‍යවස්ථා යටතේ ඉටු විය යුතුව තිබූ නොනිම් කාර්‍යයන් සම්පූර්ණ කලයුතු වේ. ඉහත දක්වෙන සේවාවන් වල ව්‍යවස්ථා යටතේ 2004.01.01 වන දිනට පෙර ආරම්භ කරන ලද එහෙත් අවසන් නොකළ බඳවා ගැනීම් ද ඊට ඇතුළත් ය.

## 02. අන්තර්ග්‍රහණය :-

යථෝක්ත සේවාවන් වල 2004.12.24 වන දිනට සේවයේ නියුතු/සේවය ආවරණය වන ස්ථිර තනතුරු සහිත පත්වීම්ලාභී නිලධරයන් ව්‍යවස්ථා සංග්‍රහයේ අංක. XIII දරණ පරිශිෂ්ඨයේ දක්වෙන ආකෘතියට අනුකූලව සකස් කරන ලද මනාප ප්‍රකාශ පත්‍රයක් සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානයා ඉදිරිපිටදී අත්සන් තබා දෙපාර්තමේන්තු ප්‍රධානයා මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කලයුතුය. සේවයට අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළ කළ නිලධරයන් අන්තර්ග්‍රහණය කිරීමට ද විශ්‍රාම ගැන්වීමට මනාපය පළ කරනු ලබන නිලධාරීන් විශ්‍රාම ගැන්වීමට ද ඒ අනුව කටයුතු කරනු ඇත. (සේවයට අන්තර්ග්‍රහණය වීමට සම්පූර්ණ කලයුතු කරුණු ව්‍යවස්ථා සංග්‍රහයේ 14:1 හා 14:4 වගන්ති වල දක්වේ.) විශ්‍රාම ගන්වනු ලබන නිලධරයන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 හා 07 වගන්ති වල දක්වෙන වරප්‍රසාද හිමිවේ.

## 03. මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීම :-

I. නිලධරයන් විසින් භාරදෙන මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කිරීමේ දී දෙපාර්තමේන්තු ප්‍රධානයන් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතුය.

(අ) ප්‍රකාශ පත්‍රයේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බව සහ ඔහු එහි සඳහන් වන දිනයේ දී ප්‍රකාශය සහතික කරන නිලධරයා ඉදිරිපිට දී අත්සන් කළ බව.

(ආ) සහතික කරන නිලධරයා, දිනය යොදමින් සහතික කර අත්සන් තබා දිනමුද්‍රා/නිලමුද්‍රා තබා ඇති බව.

(ඇ) ප්‍රකාශ පත්‍රයේ අනු පිටපතක් නිලධරයාගේ දෙපාර්තමේන්තු පෞද්ගලික ලිපිගොනුවේ ඇතුලත් කර ඇති බව.

II. මනාප ප්‍රකාශ පත්‍ර (මුල් පිටපත්) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවන විට ඒවා මෙම චක්‍රලේඛයට අමුණා ඇති "අ" ආකෘතියට අනුකූලව සකස් කරන ලද ලේඛනයක් සමග එවිය යුතු වේ.

III. විදේශගත නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍ර එරට ශ්‍රී ලංකා තානාපති කාර්‍යාල ප්‍රධානයන් ඉදිරිපිටදී අත්සන් කර සහතික කර දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත එවිය යුතුවේ. තානාපති සේවා නොමැති රටවල නිලධරයන්ගේ ප්‍රකාශ පත්‍ර අත්සන් කර තම දෙපාර්තමේන්තු ප්‍රධානයන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් හරහා එවීම ප්‍රමාණවත් වේ.

## 04. චක්‍රලේඛයේ විධිවිධාන නිලධරයන්ට දැන්වීම :-

සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය ප්‍රකාශ කිරීමට දී ඇති කාලය 2005.03.23 වන දිනෙන් අවසන් වේ. සේවා ව්‍යවස්ථාවේ අංක. XIII දරණ පරිශිෂ්ටයේ දැක්වෙන ආකෘතියට අනුව තම මනාප ප්‍රකාශ පත්‍රය අවසාන දිනය නොඉක්මවා එවන ලෙසට දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන සියලුම නිලධරයන්ට දැන්විය යුතුය. විදේශ සේවයේ නියුතු, දීර්ඝකාලීනව දේශීය නිවාඩු ලබා සිටින, විධිමත් ලෙස විදේශීය නිවාඩු ලබා විදේශගතව සිටින, වෙනත් ආයතන වලට තාවකාලිකව මුදහැර ඇති, වැඩ තහනම් කර ඇති සහ සේවය අත්හිටුවා ඇති නිලධරයන්ට ද ඔවුන් විසින් අවසන් වරට දැනුම් දී ඇති ලිපිනයන් වලට ලියාපදිංචි තැපෑලෙන් මේ බව දන්වා යැවිය යුතු වේ.

## 05. මනාපය ප්‍රකාශ නොකරන නිලධරයන් :-

2005.03.23 දින වන විටත් මනාප ප්‍රකාශ පත් ඉදිරිපත් නොකළ නිලධරයන් සම්බන්ධව වාර්තාවක් මේ සමග එවන "ආ" ඇමුණුමේ දැක්වෙන ආකෘතියට අනුකූලව සකස් කර 2005.03.31 වන දිනට පෙර ලැබෙන සේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු වේ.

## 06. අන්තර්ග්‍රහණය කෙරෙන කාලසීමාව තුළ විශ්‍රාම යන නිලධරයන් :-

2004.12.24 වන දිනෙන් පසු දිනෙක විශ්‍රාම යාමට නියමිත නිලධරයන් අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද ප්‍රකාශ පත්‍රයක් විධිමත් ලෙස ඉදිරිපත් කර ඇත්නම් සේවයට අන්තර්ග්‍රහණය කර විශ්‍රාම ගන්වන අතර එසේ නොවන විට නිලධරයා නියුතුව සිටි සේවයේ සිටියා සේ සලකා විශ්‍රාම ගන්වනු ලැබේ.

## 07. සේවයේ තනතුරු :-

අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයන් 2004.01.01 දිනට පත්කරනු ලබන සේවයේ තනතුරු පහත සඳහන් වන පරිදි වේ.

| 2003.12.31 වන දිනට පූර්ව සේවයේ දැරූ තනතුර. | 2004.01.01 වන දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පත්කරන තනතුර. |
|---|---|
| II "ආ" පන්තියේ නිලධරයන් | III පන්තියට |
| II "අ" පන්තියේ නිලධරයන් | II පන්තියට |
| ලඝුලේඛක සේවයේ II පන්තියේ නිලධරයන් | II පන්තියට |
| I පන්තියේ නිලධරයන් | I පන්තියට |
| අධි පන්තියේ නිලධරයන් | අධි පන්තියට |

## 08. සේවා කොන්දේසි :-

අන්තර්ග්‍රහණය කිරීමේ දී සේවා/තනතුරු නාම වෙනස් වුව ද සමහර සේවා/තනතුරු වල කාර්‍යයන්හි දී ඊට විශේෂ වූ කරුණු මත නියම කරන ලද සේවා කොන්දේසි වෙතොත් ඒවා එලෙසම ක්‍රියාත්මක කළයුතුය.

උදහරණ :- තනතුරක රාජකාරි ඉටු කිරීමේ දී ඇප තැන්පත් කළයුතු වීම.

## 09. වැටුප් :-

සේවයට අන්තර්ග්‍රහණය කල බවට පත්වීම් බලධරයා විසින් විධිමත් ලෙස නිකුත් කල පත්වීම් ලිපියක් ඇති විටෙක ව්‍යවස්ථා සංග්‍රහයේ 4 වන ඡේදයේ දක්වෙන පරිදි නියමිත වැටුප් ක්‍රමය මත අනුරූපී වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවිය හැක. 14:5 වගන්තියේ දක්වෙන පරිදි වැටුප් පරිවර්තන සිදු කළයුතුය.

## 10. දැනටමත් නිලධරයන්ට පෞද්ගලික වන සේ වැටුපෙහි පිහිටුවන ලද අවස්ථා :-

I. පූර්ව සේවා ව්‍යවස්ථා වලින් සළසා නොමැති එහෙත් රජය විසින් අනුමත කල වෙනත් විධිවිධාන යටතේ නිලධරයන් තමන්ට පෞද්ගලික වන සේ මේ දක්වා ලබන වැටුප්, සේවයේ අන්තර්ග්‍රහණය කිරීම හේතුවෙන් ලැබෙන වැටුපට වඩා වැඩි වේ නම් එම වැඩි වැටුප ඔවුන්ට පෞද්ගලික වන සේ තවදුරටත් ගෙවිය හැක.

II. සේවයේ උසස්වීම්, කාර්‍යක්ෂමතා කඩඉම් වැනි අවස්ථා වල දී ගණන් ගනු ලබන්නේ සේවා ව්‍යවස්ථාවන්ට අදාළ වන පරිදි දිගටම සිටියා යයි සළකන විට ලැබිය හැකි වැටුප් පියවරයන්ය.

## 11. උසස් වීම් හා කාර්‍යක්ෂමතා කඩඉම් :-

ව්‍යවස්ථා සංග්‍රහයේ 11, 12 හා 13 වගන්ති යටතේ දක්වෙන උසස්වීම් පරිපාටි ද, 5 වගන්තියේ දක්වෙන කාර්‍යක්ෂමතා කඩඉම් විභාග ද 2004.01.01 වන දින සිට වලංගු වේ. එසේ වුව ද ඔවුන්ට 14:3 වගන්තියේ දක්වෙන අන්තර්කාලීන සහන විධිවිධාන වලට හිමිකම් ඇත. තව ද පූර්ව සේවා ව්‍යවස්ථාවන් යටතේ 2004.01.01 දිනට පෙර පැවැත්විය යුතුව තිබූ නමුත් නොපවත්වන ලද උසස් කිරීමේ හා කාර්‍යක්ෂමතා කඩඉම් විභාග වේ නම් ඒවා ඉදිරියට පූර්ව සේවා ව්‍යවස්ථා වලට අනුකූලව පැවැත්වීමට පියවර ගැනේ. එම විභාග වලින් සමත් වන නිලධරයන් පූර්ව සේවාවන් තුළ විභාග සමත් වූවා ලෙස සළකනු ලැබේ.

**12. පාලනය :-**

I. අධි පන්තිය :-


අධි පන්තියේ නිලධරයන්ගේ ස්ථානමාරුවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත පරිපාටියට යටත්ව රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම් විසින් සිදු කරන අතර අනෙකුත් පාලන කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ඇත.

II. I, II හා III පන්ති :-

සේවයේ I, II හා III යන පන්ති වල නිලධරයන් සම්බන්ධ සියලු කටයුතු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පාලනය කරනු ඇත.

13. ප්‍රාදේශීය මහලේකම් කාර්‍යාල වල සේවය කරන ක්ෂේත්‍ර නිලධරයන් නොවන පළාත් සභා කාර්‍ය මණ්ඩල ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරනු ඇත. ඒ අනුව ඒකාබද්ධ සේවා අංක 02/2002 චක්‍රලේඛය ප්‍රකාරව 2002.12.31 දින හෝ එදිනට පෙර මනාප ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කළ නිලධරයන්ට මධ්‍යම රජයට අන්තර්ග්‍රහණය කිරීමේ පත්වීම් ලිපිය මේ වන විට ලැබී නැතත් මෙම චක්‍රලේඛය යටතේ කටයුතු කිරීමට බාධාවක් නොවේ.

14. අංක. 1372/23 හා 2004.12.24 දනම අතිවිශේෂ ගැසට් පත්‍රයේ පිටපතක් ද මේ සමග එවමි.



**එස්.සී.මාන්නප්පෙරුම**

ලේකම්

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

"ආ" ඇමුණුම

**දෙපාර්තමේන්තු ප්‍රධානයන් - අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට**
**අන්ර්ග්‍රහණය වීම සම්බන්ධව නිලධරයන්ගේ මනාප ප්‍රකාශ පත්‍ර එවීමේ ලේඛනය**

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :- ..............................................................................

| අනු අංකය | පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම | ඔහු/ඇය අයත් පූර්ව සේවය හා තනතුර | මනාප ප්‍රකාශය කළ දිනය | අන්තර්ග්‍රහණය වීමට කැමැත්ත පළ කර ඇත්නම් "A" අක්ෂරය ද විශ්‍රාම ගැන්වීමට මනාපය පළකර ඇත්නම් "R" අක්ෂරය ද මේ තීරයේ සටහන් කරන්න. |
|---|---|---|---|---|---|
| | | | | | |

දිනය :- ...............................

අත්සන :-
තනතුර :-
නිලමුද්‍රාව :-

සැ: යු : 1. 2005.01.01 වන දින සිට 2005.03.23 දින දක්වා ලැබෙන මනාප ප්‍රකාශ පත්‍ර සතිපතා මෙම ආකෘතිය අනුව වාර්තාවක් සමග ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය.

"අ" ඇමුණුම

## ව්‍යවස්ථාවේ XIII පරිශිෂ්ඨය අනුව මනාපය ප්‍රකාශ නොකළ නිලධරයන්ගේ වාර්තා

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :- ..............................................................................

| අනු අංකය | පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම | සේවය හා තනතුර | අවසන් වරට දැනුම් දී ඇති ලිපිනය | අවසන් වරට සේවයට වාර්තා කළ දිනය | වෙනත් තොරතුරු (මනාපය පළ නොකිරීමට හේතු ඇත්නම් පැහැදිලි කරන්න) |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

දිනය :- ..............................

අත්සන :-
තනතුර :-
නිලමුද්‍රාව :-

සැ: යු : 1. නිලධාරියා නොදන්වා සේවයට නොපැමිණ සිටින්නේ ද? සේවය අතහැර ගොස් ඇත්ද? සේවය නවතා ඇත්ද? යන .ලෙසට සේවා තත්ත්වයන්, ඔහු සම්බන්ධව ගෙන ඇති පියවරයන් ඇත්නම් ඒවා ද සමග දැන්විය යුතුය.